# TA-4748 SRI
# Independent External Monitoring of Resettlement Activities of the Southern Transport Development Project

# ටීඒ - 4748 ශ්‍රී
# දක්‍ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ නැවත පදිංචි කරවීමේ කටයුතු පිළිබඳ ස්වාධීන බාහිර මෙහෙයුම

## උපදේශන සේවා සඳහා අවධානය යොමු කළ යුතු නිර්දේශිත කරුණු පිළිබඳ ලුහුඬු සටහනක්

### අ) සේවාවන්හි විෂයපථය

1.) තාක්‍ෂණික සහාය සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් සහ ඇගයුම් විශේෂඥයෙකුගේ පුද්ගල මාස 3 ක සේවාවක් ද, දේශීය උපදේශන ආයතනයක පුද්ගල මාස 23 ක සේවාවක් ද වශයෙන් පුද්ගල මාස 26 උපදේශන සේවාවක් අවශ්‍ය වන්නේය. දේශීය උපදේශන ආයතනය එහි කණ්ඩායම් ප්‍රධානියා වශයෙන් පුද්ගල මාස 12 ක යෙදවුම් සැපයීම පිණිස ආදායම් ඉපදවීමේ කටයුතු පිළිබඳ ප්‍රබල පසුබිමකින් යුත් සමාජ සංවර්ධන විශේෂඥයෙකුගෙන් ද. පුද්ගල මාස 8 ක යෙදවුම් සැපයීම පිණිස පළපුරුදු සුදුසුකම් ලත් සංඛ්‍යාලේඛනඥයෙකුගෙන් ද, පුද්ගල මාස 3 ක යෙදවුම් සැපයීම පිණිස පළපුරුදු පහසුකම් සපයන්නෙකු / ප්‍රමාණකයෙකුගෙන් (moderator) ද සමන්විත වන්නේය. දේශීය උපදේශන ආයතනය විසින් ස්වකීය කාර්යමණ්ඩලය මඟින් හෝ බාහිර සම්පත් දායකයන් සමඟ යොදාගත් වැඩපිළිවෙලක් මඟින් හෝ අවශ්‍ය ක්‍ෂෙත්‍ර වැඩ හා දත්ත විශ්ලේෂණයන් සිදු කරනු ලබන අතර පහතින් විශේෂිත වශයෙන් දක්වා ඇති ආකාරයට වැඩමුලු සංවිධානය කර පැවැත්විය යුතු වන්නේය. ජාත්‍යන්තර උපදේශකයා ඒකපුද්ගල පදනමක් මත සේවයට යොදා ගනු ලබන අතර ආසියානු සංවර්ධන බැංකුවේ (ආසබැව) *උපදේශකයන්ගේ සේවය ලබා ගැනීමට අදාළ මාර්ගෝපදේශයන්* හි දක්වා ඇති ලිහිල් කරන ලද තාක්‍ෂණික යෝජනා පදනම් කර ගෙන ආසබැව විසින් දේශීය උපදේශන ආයතනය සේවය සඳහා යොදා ගනු ලබන්නේ තත්වය සහ පිරිවැය මත පදනම් වූ තෝරා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කිරීමෙනි. දේශීය ආයතනයට පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ජා පැවැත්වීම, දත්ත සමුදාය කළමනාකරණය හා පරිගණක දත්ත නිවේශය පිළිබඳ පළපුරුද්දක් සහිත කාර්යාලයානුබද්ධ කාර්යමණ්ඩලයක් සිටිතැයි අපේක්‍ෂා කෙරේ.

2) ආසංබැව සහ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ජපාන බැංකුව (ජාසංජබැව) විසින් එකඟතාවට පත් පූර්වනිගමිත දර්ශක සහ ඉලක්ක හෝ ප්‍රමිතිමාලාවකට අනුකූල වන නැවත පදිංචි කරවීමේ වැඩකටයුතුවල සඵලදායීත්වය සහ කාර්යක්‍ෂමතාව මෙහෙයවීම පිණිස වරින්වර කරනු ලබන කාර්යාල මට්ටමේ විමර්ශන, පුද්ගල සම්මුඛ සාකච්ජා සහ ක්‍ෂෙත්‍ර නිරීක්‍ෂණවල සංයුතියක් උපදේශකයන් විසින් භාවිතයට යොදා ගනු ලබනු ඇත.

3) තාක්‍ෂණික සහාය අදියර හතරකින් ක්‍රියාත්මක කෙරේ : (i) සැලසුම් කිරීම සහ ඒවා වලංගුබවට පත් කිරීම (මාස 2 කි). (ii) පරීක්‍ෂාවට ලක් කිරීම සහ ඒවායේ නිවැරදි බව තහවුරු කරලීම (මාස 1 කි); (iii) අඛණ්ඩ මෙහෙයුම (මාස 3 කි); (iv) දක්‍ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියෙහි (දප්‍රසංව්‍යාය) මුලු දිග වන කි.මී. 128 ක පමණ ප්‍රමාණය හෝ ඊට අදාළ පහසුකම් සහ වැඩබිම් පිළිබඳ ව කලින් කලට සිදු කරන මෙහෙයුම් (මාස 18 කි). 2002 ඔක්තෝම්බර් මස 22 වන දින ආසංබැව අනුමත කරනු ලැබූ යළි පදිංචි කරවීමේ සැලැස්මට අදාළ සියලු වැඩකටයුතු මෙහෙයවීමට උපදේශකයන් විසින් ප්‍රයත්න දැරිය යුතු වන්නේය.

4) තාක්‍ෂණික සහායෙහි මුල් මාස 6 තුළ මෙහෙයුම් රාමුකට්ටුවක් (Framework) සැලසුම් කිරීම, මාර්ග සංවර්ධන අධිකාරියේ (මාසංඅය) දත්ත සමුදායන් සහ ස්වාධීන ක්‍ෂෙත්‍රචාරිකා අනුසාරයෙන් එම රාමුකට්ටුවේ වලංගුභාවය තහවුරු කර ගැනීම, එකඟතාවට පත් ඉලක්ක සහ ප්‍රමිති සපුරා ගැනීමට හැකියාවක් නොමැති ක්‍රියාකාරකම්වල ආකාරයන් හඳුනා ගැනීම, මාසංඅය සඳහා නිවැරදි කිරීමේ ක්‍රමයන් යෝජනා කිරීමට යාන්ත්‍රණයක් ඇති කරලීම සහ ඊළඟ මාස 18 ක කාලසීමාව සඳහා වැඩසැලැස්මක් පිළියෙල කිරීම උපදේශකයන් විසින් සිදු කළ යුතු වන්නේය. මෙහෙයුම් සිදු කළ යුතු මූලික අංග අතරට පහත දැක්වෙන

දේ අයත් වන නමුදු සිදු කළ යුතු දේ ඒවාට සීමා නොවේ. i) බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ (වත්කම් හා ආදායම් ඇතුළුව) ජීවන තත්වය; ii) බලපෑමට ලක් වූ පුද්ගලයන්ට වන්දි සහ සෙසු දීමනා ගෙවීම් නිසි කලට හා පරිපූර්ණ වශයෙන් සිදු කිරීම; iii) මාසංඅය විසින් ස්ථාපිත කරන ලද යළි පදිංචි කරවීමේ ස්ථානයන්හි භෞතික තත්වය; (iv) සිය කැමැත්තෙන් ප්‍රතිස්ථානගත වූ පුද්ගලයන්ගේ සමාජ - ආර්ථික තත්වය සහ v) බලපෑමට ලක්වූ පුද්ගලයන් විසින් උපදේශකයන්ගේ අවධානයට ලක් කරන ලද විශේෂ හෝ මතුවට පැන නැගිය හැකි ගැටළු සහ ඒවාට මාසංඅයේ ප්‍රතිචාර. අවශ්‍ය වුවහොත් යළි පදිංචි කරවීම් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුකුල වන පරිදි සඵලදායීත්‍වය සහ කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් යෝජනා කරනු ඇත.

5) අදියර අංක 1 හිදී ආසංබැව, ජාසංජබැව සහ මහාමාර්ග අමාත්‍යාංශය (මමාඅය) සමඟ සමීප සම්බන්ධතාවයකින් කටයුතු කර, උපදේශකයන් විසින් මෙහෙයුම් රාමුකට්ටුවක් වර්ධනය කරගනු ලබන්නේය. එසේ ම ඔවුන් විසින් හරිවැරදි බැලීමේ නියමු පරීක්‍ෂණයක් සිදු කර, සමස්ත තාක්‍ෂණික සහාය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව සහ බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්‍වයට අනිසි ලෙස මැදිහත් නොවන පරිදි, ඔවුන්ගේ ජීවන මට්ටම, ජීවන තත්‍වය, තෘප්තිමත්භාවය පිළිබඳ සාමාන්‍ය තත්‍වය ආදිය පිළිබඳ අඛණ්ඩ විමර්ශණයක් සිදු කිරීම පිණිස ක්‍රමවේදයක් සකසා ගත යුතු වන්නේය.

එයට අතිරේක වශයෙන්, නියැදිගත කිරීමේ ක්‍රමෝපායක්, ක්ෂෙත්‍ර දත්ත එක්රැස් කිරීම පිණිස ප්‍රශ්නාවලි/සමීක්‍ෂණ ආකෘතිපත්‍ර සහ නියමිත කාලසීමාවල් දැක්වෙන යුත් සැලැස්මක් උපදේශකයන් විසින් සම්පාදනය කරගත යුතු ව ඇත.

6) අදියර අංක II හි දී පරිපූර්ණ ක්‍ෂෙත්‍ර පරීක්‍ෂණයක් මඟින් මෙහෙයුම් රාමුකට්ටුව වලංගුබවට පත් කර, අවශ්‍ය වුවහොත් ක්‍රමවේදය තවදුරටත් මනාව සකසා ගෙන, කාර්ය වැඩසටහන අවසාන වශයෙන් නිගමනය කෙරෙනු ඇත. එළඹුම සහ දර්ශක පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස උපදේශකයා විසින් ආසංබැව, ජාසංජබැව සහ අනෙකුත් අනුබද්ධිතයන් (Stakeholders) සම්බන්ධ කර ගනිමින් වැඩමුලුවක් ද සංවිධානය කළ යුතු වන්නේය.

7) අදියර අංක III හි දී අඛණ්ඩ මෙහෙයුම් සිදු කරන අතර එම අදියර නිමාවට පත් කරනු ලබන්නේ වැඩමුලුවකිනි.

8) අදියර අංක IV හිදී මෙහෙයුම් ද්විපාර්ෂික ව සිදු කෙරේ. එයට අමතර වශයෙන් උපදේශකයන් විසින් තම සොයා ගැනීම් සහ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ද්විවාර්ෂික වැඩමුලු සංවිධානය කර පවත්වනු ලබන්නේය. ඔවුන් විසින් සිද්ධි අධ්‍යයන මාලාවක් සිදු කර, ප්‍රධාන නියැදියෙන් තෝරා ගත් බලපෑමට ලක් වූ පුද්ගලයන් පිරිසක් පිළිබඳ විමර්ශණයක් අඛණ්ඩ සිදු කිරීම ද කළ යුතු වේ. තෝරා ගන්නා ලද බලපෑමට ලක් වූ පුද්ගලයන් පදනම් කරගෙන සිදු කරන සිද්ධි අධ්‍යයනය මඟින් අදහස් කෙරෙන්නේ ආරම්භයේ සිට අනුගමනය කළ යළි පදිංචි කරවීමේ සහ ප්‍රතිස්ථානගත කිරීමේ ක්‍රියාවලියන්හි ප්‍රබලතා සහ දුර්වලතා හුවා දක්වා, අනාගතයේ දී එම ක්‍රියාවලියන් වැඩිදියුණු කරලීම පිණිස ගත හැකි ක්‍රියාමාර්ග කවරේද යන්න හුවා දැක්වීමයි.

**ආ) අවධානය යොමු කළ යුතු නිර්දේශිත කරුණු**

9. උපදේශකයන් විසින් කළ යුතු කර්තව්‍යයන් අතරට පහත දැක්වෙන දේ ඇතුළත් වන නමුදු, කළ යුතු දේ එකී කර්තව්‍යයන්ට පමණක් සීමා නොවේ :

**අදියර I (කාලසීමාව මාස 2 කි)**

10. මෙම අදියර සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් සහ ඇගයුම් විශේෂඥයාගේ පුද්ගල මාස 1.5 ක කාලසීමාවක් පිණිස වන කාර්යස්ථාන සේවාවක් ද, මතු දැක්වෙන දේශීය උපදේශකයන්ගේ පුද්ගල මාස 2 බැගින් වූ සේවාවක් ද අවශ්‍ය කෙරේ : i) සමාජ සංවර්ධන විශේෂඥ/කණ්ඩායම් ප්‍රධානියා සහ ii) සංඛ්‍යාලේඛනඥයා. ඊට අමතර ව iii) වැඩමුලුව පහසු කරවන්නා / ප්‍රමාණකයාගේ (moderator) මාස 0.5 ක සේවාවක් ද අවශ්‍ය වේ. උපදේශකයන් විසින් :

i) දර්ශක, ඉලක්ක, ක්‍රියාමාර්ග ආදිය ලුහුඬින් දක්වමින් මෙහෙයුම් රාමුකට්ටුවක්, වැඩමුලු සහ ඊට ඇතුළත් විය යුතු සාකච්ඡා මණ්ඩප සාමාජිකයන් පිළිබඳ ආකෘතියක් සහ යළි පදිංචි කරවීම ක්‍රියාත්මක කිරීමට අදාළ සැලැස්මේ සඵලදායිකත්වය සහ කාර්යක්ෂමතාව ඇගැයීමට අවශ්‍ය දත්ත / තොරතුරු සහ උපලේඛනයක් (Schedule) ද පිළියෙල කරගත යුතු වන්නේ ය. හිමිකම් පිළිබඳ න්‍යාසයට (matrix) අනුරූප වන පරිදි නියමිත කාලයට වන්දි ගෙවා තිබීම සහ එය මුලුමනින් ගෙවා තිබීම, පොලී ගෙවීම්, ඉඩම් සහ නැවත පදිංචි කරවීමේ කමිටුවේ (ඉනැකව) සහ සුපිරි ඉනැකවේ ගෙවීම් සහ ඊට අදාළ කටයුතු, මාසංඅ විසින් ප්‍රතිස්ථානගත කිරීම් සිදු කරන ස්ථානයන්හි යටිතල පහසුකම්වල සහ සේවාවන්හි තත්වය, නිවාස සමිතිවල වැඩකටයුතු, ආදායම් මට්ටම් ආදිය දර්ශක මඟින් පිළිබිඹු කර දැක්විය යුතු වේ.

ii) පුද්ගලයින් සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡා, සමීක්ෂණ, නිරීක්ෂණ සහ මාසංඅයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය මාර්ගයෙන් දත්ත එක්රැස් කිරීම පිණිස ප්‍රශ්නාවලි සහ/හෝ ආකෘතිපත්‍ර පිළියෙල කළ යුතු වන්නේය. බලපෑමට ලක් වූවන් විසින් මාසංඅයට, ශ්‍රී ලංකා රජයට සහ අනෙකුත් මාධ්‍යවලට ලිපි ආකාරයෙන් ඉදිරිපත් කරන ලද තම ගැටළු සහ අවධානයට ලක් කළ යුතු කරුණු ද ඇතුල් වන පරිදි දත්ත එක්රැස් කිරීම ව්‍යුහගත කළ යුතු වන්නේය.

iii) අදාළ දත්ත පිළිබඳ කුඩා නියැදියක් යොදා ගෙන (දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදය, නියැදි ක්‍රියාපිළිවෙල අඛණ්ඩ විමර්ශනය සඳහා අවශ්‍ය වන පිරිසේ ප්‍රමාණය, නියෝජනය, නියැදිය සහ වාර්තාකරණ ආකෘතිය ඇතුළත්) සමස්ත මෙහෙයුම් රාමුකට්ටුව වලංගුභාවයට පත් කරන්න.

iv) රාමුකට්ටුව සහ වලංගුබවට පත් කිරීම පිළිබඳ ප්‍රතිඵල මෙන් ම යෝජිත වැඩ සැලැස්ම පිළිබඳ ව ද ආසංබැව, ජාසංජබැව සහ මමාඅය සමඟ සාකච්ඡා කිරීම පිණිස වැඩමුලුවක් සංවිධානය කර, එහි දී ඉදිරිපත් වූ යම් යෝජනා/සංශෝධන ඇත්නම් ඒවා ද ඇතුළත් කර රාමුකට්ටුව සහ උපලේඛනය නිමාවට පත් කරන්න.

**අදියර II (කාලසීමාව එක් මසකි)**

11. මෙම අදියර සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් සහ ඇගැයුම් විශේෂඥයාගේ මෙරට කාර්යාලයෙන් පුද්ගල මාස 0.5 ක කාලසීමාවක් සඳහා සේවාවක් ද, මතු දැක්වෙන දේශීය උපදේශකයන්ගේ පුද්ගල මාස 01 ක සේවාව බැගින් ද අවශ්‍ය කෙරේ : i) සමාජ සංවර්ධන විශේෂඥ / කණ්ඩායම් නායකයා ; සහ ii) සංඛ්‍යාලේඛනඥයා සහ ඊට අමතර වශයෙන් iii) වැඩමුලු පහසුකරවන්නා / ප්‍රමාණකයාගේ පුද්ගල මාස 0.5 ක සේවයක් ද අවශ්‍ය කෙරේ. උපදේශකයන් විසින් සිදු කළ යුතු දේ වන්නේ :

i) එකඟතාවට පත් රාමුකට්ටුවට අනුව පළමු වටයේ දී කාර්යාලය තුළ සිදු කරන විධිමත් විමර්ශන, සම්මුඛ සාකච්ඡා සහ ක්ෂෙත්‍ර නිරීක්ෂණ, දත්ත සඳහා අනෙකුත් තොරතුරු විශ්ලේෂණය කිරීම;

ii) යම් අඩුලුහුඬුකම් ඇතොත් ඒවා හඳුනා ගෙන, අවශ්‍ය වේ නම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම;

iii) ප්‍රගති වාර්තාවක් පිළියෙල කර, ප්‍රධාන සොයා ගැනීම් සහ නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ව ආසංබැව, ජාසංජබැව, මමාඅය සහ අනෙකුත් අනුබද්ධිතයන් සමඟ සාකච්ඡා කිරීම සඳහා වැඩමුලුවක් සංවිධානය කිරීම. එහි දී සොයා ගැනීම් පිළිබඳ ව මෙන් ම වාර්තා ආදියෙහි ආකෘතිය සහ අන්තර්ගතය පිළිබඳ ව ද පළ කරන අදහස් උපදේශකයන්ට ලැබෙනු ඇත.

iv) අවශ්‍ය වේ නම් රාමුකට්ටුව සහ වැඩ සැලැස්ම සංශෝධනය කර, III වන අදියර සඳහා සූදානම් වීම.

**අදියර III (කාලසීමාව මාස 03 කි)**

12. මෙම අදියර සඳහා, තාක්ෂණික සහාය අවසාන භාගයේ දී ජාත්‍යන්තර මෙහෙයුම් සහ ඇගැයුම් විශේෂඥයාගේ මෙරට කාර්යාලයේ පුද්ගල මාස 0.5 ක සේවාවක් ද, සමාජ සංවර්ධන විශේෂඥ/කණ්ඩායම් ප්‍රධානියාගේ පුද්ගල මාස 3 ක සේවාවක් ද, සංඛ්‍යාලේඛනඥයාගේ පුද්ගල මාස 2 ක සේවාවක් ද, වැඩමුලුවේ පහසුකම් සපයන්නා / ප්‍රමාණකයාගේ පුද්ගල මාස 0.5 සේවාවක් ද, එයට අමතර ව සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා ක්ෂෙත්‍ර කටයුතු ද අවශ්‍ය කෙරේ. මෙම අදියරේ දී කළ යුතු ප්‍රධාන කර්තව්‍යයන් අතරට පහත දැක්වෙන දේ ඇතුළත් වන නමුදු කළ යුතු දේ එකී කර්තව්‍යයන්ට පමණක් සීමා නොවේ :

i) ආසංබැව සමඟ එකඟතාවට පත් වැඩ සැලැස්මට අනුව මෙහෙයුම් සහ වාර්තාකරණ කටයුතු සිදු කිරීම;

ii) සිද්ධි අධ්‍යයනයන් හඳුනා ගැනීම සහ ආසංබැව සමඟ සාකච්ඡා කිරීම පිණිස යෝජනාවල කෙටුම්පතක් පිළියෙල කිරීම;

iii) දෙවනි අදියරේ දී සිදු කළ සොයා ගැනීම් හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ව සහ II වන අදියරේ නිර්දේශවලින් ඇති වූ ප්‍රතිඵල සාකච්ඡා කිරීම පිණිස අදියර අවසානයේ දී වැඩමුලුවක් පැවැත්වීම

**අදියර IV (කාලසීමාව මාස 18 කි)**

13) මෙම අදියර සඳහා තාක්ෂණික සහාය අවසාන භාගයේ දී ජාත්‍යන්තර මෙහෙයුම් සහ ඇගැයුම් විශේෂඥයාගේ පුද්ගල මාස 0.5 ක වැඩබිමේ ස්ථානගත සේවාවක් ද, සමාජ සංවර්ධන විශේෂඥ/කණ්ඩායම් ප්‍රධානියාගේ පුද්ගල මාස 06 ක කඩින්කඩ සේවාවක් ද, සංඛ්‍යාලේඛනඥයාගේ පුද්ගල මාස 03 කඩින්කඩ සේවාවක් ද, වැඩමුලුවේ පහසුකම් සපයන්නාගේ/ප්‍රමාණකයාගේ මාස 1.5 ක සේවාවක් ද, එයට අමතර ව සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය කෙරේ. මෙම අදියරේදී කළ යුතු ප්‍රධාන කාර්යයන් අතරට පහත දැක්වෙන දේ ඇතුළත් වන නමුදු, කළ යුතු දේ එකී කර්තව්‍යයන්ට පමණක් සීමා නොවේ.

i) ආසංබැව සමඟ එකඟතාවට පත් වැඩ සැලැස්මට අනුව මෙහෙයවීම සහ වාර්තාකරණය සිදු කිරීම;

ii) සිද්ධි අධ්‍යයනයන් සම්බන්ධයෙන් එකඟතාවට පැමිණීම සහ ආසංබැව සමඟ සාකච්ඡා කිරීම සඳහා යෝජනාවල කෙටුම්පතක් පිළියෙල කිරීම;

iii) උපදේශකයන්ගේ සොයා ගැනීම්, නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කරන ලද නිර්දේශවලින් ලද ප්‍රතිඵල සාකච්ඡා කිරීම සඳහා සෑම සය මසකට වරක් වැඩමුලු පැවැත්වීම

**ඇ) ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන**

14. මහාමාර්ග අමාත්‍යාංශය කාර්යයන් ක්‍රියාවට නැංවීමේ නියෝජ්‍යායතනය වශයෙන් කටයුතු කරමින් තාක්ෂණික සහාය සපයන උපදේශකයන්ට මාසංඅය සතු අදාළ දත්ත සමුදායන්ට, තොරතුරු මූලාශ්‍රවලට හා ව්‍යාපෘති සිදු කෙරෙන ස්ථානයන්ට නිර්බාධිත ව පිවිසීමේ පහසුකම් එය විසින් සපයනු ඇත. ස්වාධීනත්වයත්, අපක්ෂපාතීත්වයත් සහතික කරනු වස් ශ්‍රී ලංකාවේ නේවාසික දූත පිරිසේ කාර්යමණ්ඩලය ජාසංජබැව සමඟ සම්බන්ධීකරණය වෙමින් තාක්ෂණික සහායේ කටයුතු පාලනය කරන අතර, තාක්ෂණික සහාය සපයන උපදේශකයන්ට මග පෙන්වීම සහ උපදෙස් සැපයීම සම්බන්ධයෙන් එය සෘජු ව වගකීම දරනු ලබන්නේය. ශ්‍රී ලංකාවේ නේවාසික දූත මණ්ඩලය විසින් උපදේශකයන්ගේ සොයා ගැනීම් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිසත්, අවශ්‍ය වූ තන්හි දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා වන යාන්ත්‍රණය සහ උපලේඛනය පිළිබඳ එකඟතාවට පැමිණීම පිණිසත් ජාසංජබැව, මමාඅය සහ මාසංඅය සමඟ පවත්වන ත්‍රෛමාසික රැස්වීම් සංවිධානය කරනු ලැබේ. ඉන්පසු මහාමාර්ග අමාත්‍යංශ ලේකම්වරයා එබඳු ක්‍රියාමාර්ග ඉන් අනතුරුව පැවැත්වෙන ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ප්‍රකාශයට පත් කර, ඒ අනුව කටයුතු කිරීමට උපදෙස් දෙනු ඇත. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවල පවත්නා තත්වය සහ ප්‍රතිඵල වාර්තා කිරීමේ ව්‍යාපෘතියේ

ප්‍රධාන අනුබද්ධිතයන්ට සාකච්ඡා මණ්ඩප වනු ඇත්තේ උපදේශකයන් විසින් සංවිධානය කරනු ලබන ද්විවාර්ෂික වැඩමුලුය.

15. තාක්‍ෂණික සහාය 2006 මාර්තු 20 දා සිට 2008 මාර්තු 29 වන දින දක්වා මාස 24 ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. නියමිත කාලයෙන් කාලයට පවත්වන තාක්‍ෂණික සහාය පිළිබඳ වැඩමුලුවලට අමතර ව, මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් පවත්වන දක්‍ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කමිටුව, තාක්‍ෂණික සහාය පිළිබඳ උපදේශකයන්ට ස්වකීය නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ යාන්ත්‍රණය සහ ෂෙඩ්‍යුලය සම්බන්ධයෙන් අවසාන නිගමනයට එළඹෙන සාකච්ඡා මණ්ඩපය වශයෙන් සැලකේ. නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම උසුලන ආයතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි.

16. ජාත්‍යන්තර උපදේශකයා දේශීය උපදේශකයන් සමඟ සමීප සම්බන්ධීකරණයකින් කටයුතු කරනු ලබන අතර, අංක 1 අදියරේ දී මෙහෙයුම් රාමුකට්ටුව පිළියෙල කිරීම හා නියමු පරීක්‍ෂණයට භාජන කිරීම හා ප්‍රශ්නාවලි සකසා ගැනීම, නියැදි ශිල්පීයක්‍රම, සිද්ධි අධ්‍යයනයට අදාළ මාතෘකා හා එළඹුම සහ අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ වාර්තා කිරීම ආදිය සම්බන්ධයෙන් මූලික වගකීම ඔහු විසින් දරනු ලබන්නේය. අදියර අංක II සහ III හි දී ස්වකීය කාර්යාලයේ සිටිමින් ජාත්‍යන්තර උපදේශකයා ඉටු කරන සේවාවන්, තෝරාගත් ප්‍රගති වාර්තා, වාර්ෂික වාර්තා සහ වැඩමුලු ආකෘති පිළිබඳ තම අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීමේ ස්වරූපයක් දරනු ඇත. අදියර අංක IV හි දී ජාත්‍යන්තර උපදේශකයා අවසාන වැඩමුලුවට සහභාගි වෙමින්, අවසාන මෙහෙයුම් වාර්තාව සහ ඒ හා බැඳුණු සිද්ධි අධ්‍යයනයන් පිළියෙල කිරීමට කණ්ඩායම් නායකයාට සහාය වේ. සොයා ගැනීම්, නිර්දේශ, වාර්ෂික වාර්තාව හා අවසාන කෙටුම්පත් වාර්තාව පිළිබඳ ව ජාත්‍යන්තර උපදේශකයා සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම, ඔහුගේ දායකත්වය ඒවාට ලබා ගැනීම ඇතුළු ව ව්‍යාපෘතියේ සමස්ත කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වගකීම කණ්ඩායමේ නායකයා විසින් දැරිය යුත්තේය. දේශීය කණ්ඩායම් ප්‍රධානියා විසින් වැඩමුලු සංවිධානය කිරීම හා සිද්ධි අධ්‍යයනයන් සම්පාදනය කිරීම පිළිබඳ ව ද, උපදේශන ආයතනය විසින් කරනු ලබන ක්‍ෂෙත්‍ර කාර්යයන්, දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම පිළිබඳ ව වගකීම ද දැරිය යුතු වන්නේය. එයට අමතර ව කණ්ඩායම් නායකයා විසින් ආසබැව, ජාසංජබැව සහ මමාඅය සමඟ සාකච්ඡා කර සොයා ගැනීම් සහ නිර්දේශ පිළිබඳ ව සිය අදහස් ඉදිරිපත් කිරීම පිණිස බලපෑමට ලක් වූවන් අතුරින් තෝරාගත් පුද්ගලයන්, සමාජ වැඩසටහන් ඇගයුම සහ මෙහෙයුම පිළිබඳ ක්‍ෂෙත්‍රයට අදාළ විශේෂඥයන් මෙන් ම සමාජයේ කීර්තිමත් පුද්ගලයන්ගෙන් සමන්විත වැඩමුලු සාකච්ඡා මණ්ඩපයක් ස්ථාපිත කරගත යුතු වන්නේය.

### ඇ) වාර්තාකරණ අවශ්‍යතාවන්

17. උපදේශකයන් විසින් විශේෂිත වශයෙන් දක්වා ඇති ෂෙඩ්‍යුලයට අනුව පහත දැක්වෙන වාර්තා ඉදිරිපත් කළ යුතු වන්නේය.

| වාර්තාවේ මාතෘකාව | නියමිත දිනය | වගකීම දැරිය යුතුඅය | පිටුපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| ආරම්භක වාර්තාව | දැනුම් දුන් දිනයේ සිට සති 6 කින් | ජාත්‍යන්තර උපදේශක | 05 |
| අදියර අංක I හි අවසාන වාර්තාව | දැනුම් දුන් දිනයේ සිට සති 8 කින් | ජාත්‍යන්තර උපදේශක | 05 |
| අදියර අංක II හි අවසාන වාර්තාව | අදියර අංක II ආරම්භක දිනයේ සිට සති 4 කින් | කණ්ඩායම් නායක | 05 |
| අදියර අංක III හි වාර්තාව | අදියර අංක III අවසානයේ සිට එක් මසකින් | කණ්ඩායම් නායක | 05 |
| අදියර අංක IV හි ද්විවාර්ෂික වාර්තා | අදියර අංක III අවසානයේ සිට මාස 6 කින් සහ 12 කින් | ජාත්‍යන්තර උපදේශක සහ කණ්ඩායම් නායක | 05 + සුසංහිත තැටි 03 ක් |
| අදියර අංක IV හි අවසාන වාර්තාවේ කෙටුම්පත, අවසාන වාර්තාව සහ සිද්ධි අධ්‍යයනයන් | අදියර අංක III අවසානයේ සිට අනුපිළිවෙළින් 16, 17 සහ 18 වන මාසවල දී | ජාත්‍යන්තර උපදේශක සහ කණ්ඩායම් නායක | 10 + සුසංහිත තැටි 03 ක් |